# පූචි මගේ සිතුවිලි



සසඳුලා පනාන්දි සුබසිංහ

# පුංචි මගේ සිතුවිලි

සසඳුලා පහන්දි සුබසිංහ

ග්‍රන්ථ නාමය - පුංචි මගේ සිතුවිලි

කතෘ නාමය - සසඳුලා පහන්දි සුබසිංහ

කතෘගේ වෙනත් කෘති - මලිති
- හොඳ බබා
- පුංචි සසඳුලා හොඳ බබෙක්
- පුංචි අපිට තේරවිලි
- දළඹුවාගේ කතාව
- Kids' Mssays
- Malithi
- Little Sasandula is Good Girl
- The Story of a Little Caterpillar

ISBN අංකය - 978-624-208-030-7

ප්‍රකාශිත වර්ෂය - 2023

පුංචි මට.....

ලියන්නට.....

කියවන්නට.....

ඉගැන්වූ.....

මගේම ආදරණීය

ගුරුතුමියන්ලාටත්.....

ශෑමවිටම

මා ළඟින්ම සිටින

මගේම ආදරණීය

දෙමාපියන්ටත්.....

ආදරයෙන්

පුදමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් එලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුමකරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත්කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි

ශෂිකලා සේනාධීර
විදුහල් පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023 10 20

# මිතුරිය

කඩිසරයි හරි හොඳයි
ඉක්මනින් වැඩ කරයි
අන් අයට සහය වෙයි
මගේ මිතුරිය හරි හොඳයි
සැමවිටම සිනාසෙයි
අන් අයව තුටු කරයි
මම ඇයට ආදරෙයි
ඇය ද මට ආදරෙයි



# අම්මා

දස මසක් කුස දරා
ලේ කිරි කර පොවා
මා ඇති දැඩි කලා
මගෙ අම්මා  තමා

පාන්දර නැගිටිමින්
රස කෑම සාදමින්
මගෙ ඇඳුම් සෝදමින්
සියලු වැඩ ඇය කරයි

හොඳ නරක කියා දෙන
මගේ දිවිය ගොඩ නගන
මම  ඔබට ආදරෙයි
මග ලොවේ හිරු ඔබයි



# අහස



විටක අති සුන්දරයි
විටෙක අප බය කරයි
විටෙක වැසි ලබා දෙයි
අහස ඒ නුඹ තමයි

උදෑසන හරි හැඩයි
දහවලට හිරු  බබළවයි
කුරුලු රැන් පියාඹයි
අහස ඔබ ලස්සනයි

රාත්‍රියට තරු බබළවයි
හඳහාමි සිනාසෙයි
සූර පූරක වෙස් ගනී
අහස ඒ ඔබ තමයි

# තාත්තා

දවස පුරා අප වෙනුවෙන්
මහන්සි වී වැඩ කරමින්
අප වෙනුවෙන් වෙහෙසෙමින්
මුදල් සොයයි අප සැම වෙනුවෙන්

අප සැම ගැන සොයා බලමින්
නිති රැකවරණය දෙමින්
අපව රැකබලා ගනිමින්
දිවි ගෙවයි මගේ පියාණන්



# සමනලයා

රන් පාටට දිලිසි දිලිසි
සුමුදු පියාපත් සලමින්
මගේ ලස්සන මල් වත්තට
තව ලස්සන මලක් ඇවිත්

මල් පෙති මත වසා සිටී
චුට්ට චුට්ට පැණි උරතේ
මෙයා පුංචි මලක් නොවෙයි
හරි ලස්සන සමනල් පැටියෙක්..



# ගුරුතුමිය

උදෑසනම පාසල් එන
නිරතුරුව  අප රකින
හොඳ නරක කියා දෙන
අපේ ආදර මව් ඔබයි

සිප සතර කිරිකර පොවන....
යහමගට අප ගෙනෙන
අප දියුණුව පතන
මගේ ගුරුතුමිය ඔබයි





# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාන හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝදයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමානයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනවූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැගීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකිමෙම නිර්මාන රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයිපාසල් මට්මින් ආරම්භකර ජාතක තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ පීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකූර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු

**මෙයට**
**සෙනෙවිරත්න මහලේකම්**
**පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ**
**2023 10 20**

AKS Technologies
Your Print Partner..
CALL NOW :
+9477 50 60 30 1
akstech.walala@gmail.com